Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# අනාවරණ පරීක්ෂණය 2021

# ඉතිහාසය

**07 ශ්‍රේණිය** **කාලය පැය 02 යි**

| නම/ විභාග අංකයඃ |
|---|

සැලකිය යුතුයිඃ
සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

## I කොටස

- **අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර දී ඇති පිළිතුරු අතරින් තෝරා යටින් ඉරක් අඳින්න.**

01 පුරාණ ලංකාවේ ''ඇල්හේන්'' යනුවෙන් හඳුන්වා ඇත්තේ,

(i) පුරන් වූ හේන්ය. (ii) ඇල මාර්ගයට සමීපව පිහිටි හේන්ය.

(iii) ඇල් වී වගා කළ හේන්ය. (iv) අත්හැර දමනු ලැබූ හේන්ය.

02 1. අකලහස A යලකන්නය

2. මදහස B මැද කන්නය

3. පිටදඬහස C මහ කන්නය

නිවැරදිව ගැලපූ විට

(i) CBA (ii) ABC (iii) ACB (iv) BCA

03 මහාවංසයට අනුව පණ්ඩුකාභය රජතුමා ළමා කාලය ගතකර ඇත්තේ,

(i) දුනුමඩලාවෙහිය (ii) පඬුවස් නුවරය (iii) පණ්ඩු නුවරය (iv) දොරමඩලාවේය

04 වෙළඳපලක පාලනය පිළිබඳ නීති අඩංගු ශිලා ලිපිය වන්නේ,

(i) ගල්පොත ශිලා ලිපිය (ii) තෝනිගල ශිලා ලිපිය

(iii) බදුලු ටැම් ලිපිය (iv) ගොඩවාය ටැම් ලිපිය

05 ග්‍රීකවරු ශ්‍රී ලංකාව හැඳින්වූයේ මේ නමිනි.

(i) සෙයිලන් (ii) සිලෝන් (iii) ත්‍රැප්‍රොබේන් (iv) රත්නදීපය

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

- **ප්‍රශ්න අංක 06 - 10 දක්වා දී ඇති ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.**

06 පුරාණ වෙළඳගම් හඳුන්වා ඇත්තේ ''වාපීගම්'' ලෙසිනි. (   )

07 ශ්‍රී ලංකාවේ මෙන්ම ලෝකයේ පැරණිම ගොවිතැන් ක්‍රමය හේන් වගාවයි. (   )

08 II සේන රජතුමා කුට්ඨක සෙනෙවියාගේ ප්‍රධානත්වයෙන් සේනාවක් යවා ශ්‍රී මාර ශ්‍රී වල්ලභ රජුගේ හමුදාව පරාජය කළේ ය. (   )

09 ජූලියස් සීසර් යුක්ති සහගතව රෝමය පාලනය කළේය. (   )

10 හින්දු ජනතාව අකුරු කියවන විට ජාතකර්ම උත්සවය පැවැත්විය. (   )

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර හිස්තැන මත ලියන්න.**

11 ලංකාවේ භාවිත වූ පැරණිම කාසි ........................................................................................... ලෙස හඳුන්වයි.

12 රුවන්වැලි සෑය සැරසීමට භාතිකාභය රජතුමා ............................................................ දේශයෙන් පබලු ගෙන්වීය.

13 ආරක්ෂක බලකොටුවක් ලෙස ශක්තිමත්ව, විධිමත්ව හා විශාලව ගාලු කොටුව තනන ලද්දේ ............................................................ නම් වූ යුරෝපා ජාතියයි.

14 බුරුම රටේ අලවුංසිතු රජුගේ කාලයේ ......................................................................... රජතුමා ශ්‍රී ලංකාව පාලනය කළේ ය.

15 පුරාණ ශ්‍රී ලංකාවේ මැණික් කර්මාන්තයේ නියැලුණු ශිල්පීන් ....................................................... යනුවෙන් හඳුන්වනු ලැබේ.

- **16 සිට 20 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.**

(ලාක්ෂා / මුද්‍රා / නිගම / කටුසර / II පරාක්‍රමබාහු / I විජයබාහු / මාංශ / පන්)

16 කෙටි මූල පද්ධතියක් සහිත නියඟයට ඔරොත්තු දෙන තණහාල් මෙනේරි වැනි බෝග .............................................................................. බෝග ලෙස හඳුන්වයි.

17 කාලිංගමාඝ නම් ආක්‍රමණිකයා ලංකාවෙන් පළවාහැරීමට සමත් වූ දඹදෙණියේ පාලකයා .............................................................................. රජුය.

18 පැරණි වෙළඳ නගර මූලාශ්‍රවල දක්වා ඇත්තේ .................................................................. ලෙසිනි.

19 පුරාණ වෙළඳ ශ්‍රේණිවල අනන්‍යතාව තහවුරු කිරිම සඳහා භාවිතා කළ සංකේත ............................................................ ලෙස හඳුන්වා තිබේ.

20 කැප්පෙටියා ශාඛයේ සිටින කෘමියෙකුගේ ශ්‍රාවය යොදාගෙන ............................................................. නම් වූ පාරම්පරික කර්මාන්ත සිදුකරනු ලබයි.


**07 ශ්‍රේණිය** **ඉතිහාසය**

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

---

01 (අ)





(i) A අක්ෂරයෙන් දැක්වෙන දකුණු ඉන්දිය රාජ්‍යය කුමක් ද?

(ii) පල්ලවයන් ගොඩනඟන ලද රාජ්‍ය දැක්වෙන අක්ෂරය කුමක් ද?

(iii) E අක්ෂරයෙන් දැක්වෙන ගංගාව නම් කරන්න.

(iv) ලංකාවට ප්‍රබල ආක්‍රමණ එල්ල වූ චෝළ රාජ්‍ය දැක්වෙන අක්ෂරය කුමක් ද? (ල. 04)

(ආ)



(i) පින්තූරයෙන් දැක්වෙන්නේ කුමක් ද?

(ii) මෙය රචනා කරවන ලද පාලකයා කවුරුන් ද?

(iii) එම රජුට උදව් කළ සෙන්පතියාගේ නම කුමක් ද?

(iv) මෙම අභිලේඛනය හමුවූයේ කුමන ප්‍රදේශයකින් ද? (ල. 04)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

(ඇ)



(i) ඡායාරූපයේ දැක්වෙන වාස්තු විද්‍යාත්මක නිර්මාණය කුමක් ද?

(ii) මෙය පිහිටා ඇත්තේ කුමන ප්‍රදේශයක ද?

(iii) මෙම ගොඩනැගිල්ල හැඳින්වීමට භාවිත කළ වෙනත් නමක් ලියන්න.

(iv) මෙය කවර රජකුගේ උපත සිහිවීම සඳහා ඉදිකර තිබේද? (ල. 04)

(ඈ)



(i) ඡායාරූපයේ දැක්වෙන ගොඩනැගිල්ල කුමක් ද?

(ii) මෙම නිර්මාණය කළ රජතුමා කවුරුන් ද?

(iii) පිහිටා ඇත්තේ කුමන දිස්ත්‍රික්කයක ද?

(iv) මෙය ඉදිකිරීමට බහුලව භාවිත කොට ඇත්තේ මොනවා ද? (ල. 04)

02 (i) පුරාණ ශ්‍රී ලංකාවේ වගා කරන ලද ඇල් වී වර්ග දෙකක් නම් කරන්න. (ල. 02)

(ii) ගවයාගෙන් ලබාගත් ''පස්ගෝරස'' අතරින් 4 ක් නම්කරන්න. (ල. 04)

(iii) සාම්ප්‍රදායික වී ගොවියා මැස්සන් පළවා හැරීමට යෙදූ උපක්‍රමය කෙටියෙන් ලියන්න. (ල. 05)

03 (i) පුරාණ කාලයේ විදේශ වෙළඳාමට සම්බන්ධ වූ ලංකාවේ පිහිටි වෙළඳ නගර දෙකක් නම් කරන්න. (ල. 02)

(ii) ශ්‍රී ලංකාව සමග වෙළඳ සබඳතා පැවැත් වූ විදේශීය රටවල් හතරක් ලියන්න. (ල. 04)

(iii) පුරාණයේ පටන් ලංකාවේ විදේශ වෙළඳාම පැවති බවට ඉදිරිපත් කිරීමට ඇති සාක්ෂි 3 ක් ලියා ඉන් එකක් පැහැදිලි කරන්න. (ල. 05)


Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

04 (i) අනුරාධපුර රාජධානියේ මුල් කාලයේ දී ශ්‍රී ලංකාව පාලනය කළ රජ පෙළපත් දෙකක් නම් කරන්න. (ල. 02)

(ii) දෙවන සේන රජතුමාගෙන් ඉටු වූ සේවාවන් 4 ක් ලියන්න. (ල. 04)

(iii) අනුරාධපුර යුගයේ දී ප්‍රාදේශීය පාලන කටයුතු සංවිධානය වී ක්‍රියාත්මක වූ ආකාරය එකල සිටි නිලධාරී පිරිස ඇසුරින් පහදන්න. (ල. 05)

05 (i) පහත සටහනේ ඇති සංස්කෘතික උරුමයන් ස්පෘශ්‍ය හා අස්පෘශ්‍ය උරුම ලෙස වර්ග කර දක්වන්න. (ල. 06)




(ii) පහත අක්ෂර කොටුව ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| | | | | |
|---|---|---|---|---|
| තු | ලා | හා | ර | ස |
| ලෝ | වා | යු | ත් | ය |
| කු | පා | ව | ත | පා |
| රු | ල | ර | ර | බ |
| ස | ය | ජු | න් | ල |
| අ | න් | තා | නි | ය |

1. පුරාණයේ යකඩ කර්මාන්තයේ නිරත වූ පිරිස හැඳින්වූයේ ..................................................
2. රාජකීය දීමනා පිළිබඳ සඳහන් සෙල්ලිපි විශේෂයකි. ..................................................
3. රජුගේ චතුරංගනී සේනාවට අයත් ය. ..................................................
4. අනාගත රජකම උරුම තැනැත්තා ..................................................
5. නිශ්ශංකමල්ල රජු ශරීරයේ බරට සමානව දුන් දානය .................................................. (ල. 05)

06 (i) ග්‍රීක ශිෂ්ටාචාරය ආරම්භවීමට පෙර ක්‍රීට දිවයින මුල්කරගෙන බිහිවූ ශිෂ්ටාචාරය කුමක් ද? (ල. 02)

(ii) පෞර රාජ්‍යවල කැපීපෙනෙන ලක්ෂණ 3 ක් ලියන්න. (ල. 03)

(iii) රෝම ශිෂ්ටාචාරය පැවැති අවධියේ දී රෝම සමාජය කොටස් තුනකින් සමන්විත විය. ඒවා නම් කරන්න. (ල. 03)

(iv) රෝම ශිෂ්ටාචාරය ආරම්භ වීම සම්බන්ධයෙන් පවතින මත අතරින් එක් මතයක් විස්තර කරන්න. (ල. 03)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

07 (i) පහත A, B, C ලෙස දක්වා ඇති රජවරුන්ගේ පාලන මධ්‍යස්ථාන ලියන්න.

A දේවානම්පියතිස්ස රජු -

B I විජයබාහු රජු -

C II පරාක්‍රමබාහු රජු - (ල. 03)

(ii) රජරට ශිෂ්ටාචාරය පරිහානියත් සමග බිහි වූ ස්වාධීන ප්‍රාදේශීය පාලන ඒකක හා පාලකයින් ඇසුරෙන් පහත වගුව සම්පූර්ණ කරන්න.

| පාලන මධ්‍යස්ථානය | පාලකයා |
|---|---|
| මිනිපේ ගංදෙණිය පර්වතය | 3. ............................................ |
| 1. ............................................ | සුභ සෙනෙවි |
| රුහුණු | 4. ............................................ |
| 2. ............................................ | III විජයබාහු |

(ල. 04)

(iii) පහත සිදුවීම් හා සම්බන්ධ රජවරු පහත කොටුවෙන් තෝරා ලියන්න.

A කව්සිළුමිණ ග්‍රන්ථය රචනා කරන ලද්දේ ..........................................................................

B පළමුවරට දඹදෙණිය අගනුවර ලෙස තෝරාගෙන රාජ්‍යත්වයට පත්වූ පාලකයා ................................................................

C බුරුම දේශය ආක්‍රමණය කර ජයගත් පොළොන්නරුවේ පාලකයා ..................................................

D ගම් දහයකට වෛද්‍යවරයෙකු බැගින් පත්කොට වෙදහල් කරවූයේ ..........................................

(ල. 04)

| | |
|---|---|
| II පරාක්‍රමබාහු රජු | I විජයබාහු රජු |
| I පරාක්‍රමබාහු රජු | III විජයබාහු රජු |
| බුද්ධදාස රජු | පණ්ඩුකාභය රජු |

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

| 07 ශ්‍රේණිය | අනාවරණ පරීක්ෂණය 2021 | ඉතිහාසය |
|---|---|---|

## පිළිතුරු පත්‍රය - I කොටස

01. ඇල් වී වගා කළ හේන්  02. C B A  03. දොරමඬලාවෙහිය  04. බඳුලු ටැම් ලිපිය
05. තුැප්‍රොබේන්  06. (✗)  07. (✓)  08. (✓)  09. (✓)
10. (✗)  11. හස්එබු, කහපණ  12. රෝමානු  13. ලන්දේසීන්
14. I පරාක්‍රමබාහු  15. මණිකාර  16. කටුසර  17. II පරාක්‍රමබාහු
18. නිගම  19. මුද්‍රා  20. ලාක්ෂා  (2 x 20 = ල. 40)

## II කොටස

01. (අ) 1. පාණ්ඩ්‍ය 2. C 3. සින්දු 4. B
(ආ) 1. පනාකඩුව තඹ සන්නස 2. පළමුවන විජයබාහු
3. සිත්නාරු බිම් බුදල්නා 4. පනාකඩුව
(ඇ) 1. කොටවෙහෙර 2. දැදිගම
3. සූතිඝර චෛත්‍යය 4. මහා පරාක්‍රමබාහු රජු
(ඈ) 1. නිශ්ශංකලතා මණ්ඩපය 2. කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල
3. පොළොන්නරුව 4. පාෂාණ (ගල්) (ල. 16)

02 (i) රත්ඇල් / ඉදිඇල් / බිබිලි ඇල් (ල. 02)
(ii) කිරි / දී කිරි / ගිතෙල් / වෙඬරු / මෝරු (ල. 04)
(iii) රෙදි පාන්කඩ අඹරා මී තෙලෙන් පොඟවා කඳුරු කෝටුවල බැඳීමෙන් (ල. 05)

03 (i) අනුරාධපුරය / මාගම (ල. 02)
(ii) ඉන්දියාව / චීනය / රෝමය / පර්සියාව / අරාබිය (ල. 04)
(iii) පෙළපොත 13 පිටුවට අදාළව ලකුණු දෙන්න. (ල. 05)

04 (i) ලම්භකර්ණ / මෞර්ය (ල. 02)
(ii) 1. මිහින්තලේ රෝහලක් තැනීම.
2. මිනිපේ අමුණ අලුත්වැඩියා කිරීම.
3. මින්නේරි වැවේ සොරොව්වක් තැනීම.
4. සතුරා ආක්‍රමණ වලින් විනාශ වූ සියල්ල යළි ගොඩ නැගීම. (ල. 04)
(iii) * අනුරාධපුර නගරය අවට ප්‍රදේශ උතුරු දකුණු, නැගෙනහිර, බස්නාහිර ලෙස කොටස්වලට බෙදා පාලනය කිරීම.
* රට්ඨ නම් වූ පරිපාලන ඒකක පැවතීම.
* රට්ඨ පාලනය කරනු ලැබුවේ රට් ලදු / රට්ලද්දන් වීම (පෙළ පොත 20 වන පිටුව) (ල. 05)

05 (i) රජමාලිගා / බලකොටු / ප්‍රතිමා - ස්පෘශ්‍ය උරුම
අවුරුදු චාරිත්‍ර / කෙටිකම / ජන නැටුම් - අස්පෘශ්‍ය උරුම (ල. 06)
(ii) 1. ලෝකුරු 2. අන්තානි 3. පාබල 4. යුවරජු 5. තුලාභාර (ල. 05)

06 (i) මිනෝවන් ශිෂ්ටාචාරය (ල. 02)
(ii) භූමි ප්‍රදේශය කුඩාවීම / ජනගහනය සීමිත වීම / පුරවැසියන්ට පමණක් දේශපාලන අයිතිවාසිකම් ලැබීම (ල. 03)
(iii) ප්‍රභූන්, සාමාන්‍ය ජනතාව, වහලුන් (ල. 03)
(iv) * යුරෝපයේ සිට ඉතාලියට පැමිණි ලතින්වරු රෝමය ගොඩනැගීම.
* රොමියුලස් නැමැති වීරයකු විසින් රෝමය ගොඩනගන ලද බව. (ල. 03)

07 (i) 1. අනුරාධපුරය 2. පොළොන්නරුව 3. දඹදෙණිය (ල. 03)
(ii) 1. යාපහුව 2. දඹදෙණිය 3. සංඛ සෙනෙවි 4. බුවනෙකබාහු ආදිපාද (ල. 04)
(iii) A II පරාක්‍රමබාහු B III විජයබාහු
C I පරාක්‍රමබාහු D බුද්ධදාස රජු (ල. 04)